**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**නවවැනි පාර්ලිමේන්තුවේ**
**තෙවැනි සභාවාරය**

# පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 184

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ තෙවැනි වාර්තාව

සීනි කිලෝ ග්‍රෑම් එකක් සඳහා පනවා තිබුණු විශේෂ භාණ්ඩ බදු රු.50 සිට ශත 25 දක්වා අඩු කිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට ලැබීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාව

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කබීර් හෂීම් මහතා විසින්
2022 දෙසැම්බර් මස 05 වැනි දින ඉදිරිපත් කරන ලදී.

2022 දෙසැම්බර් මස 05 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී.

**<u>නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය</u>**
**<u>රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය</u>**

1. ගරු කබීර් හෂීම් මහතා (සභාපති)
2. ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
3. ගරු ලසන්ත අලගියවන්න මහතා
4. ගරු ප්‍රසන්න රණවීර මහතා (2022.11.19 දින සිට)
5. ගරු කේ. කාදර් මස්තාන් මහතා
6. ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
7. ගරු ඩයනා ගමගේ මහත්මිය
8. ගරු එස්. බී. දිසානායක මහතා
9. ගරු තිස්ස අත්තනායක මහතා
10. ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
11. ගරු විමලවීර දිසානායක මහතා
12. ගරු නිරෝෂන් පෙරේරා මහතා
13. ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
14. ගරු ජේ. සී. අලවතුවල මහතා
15. ගරු අශෝක් අබේසිංහ මහතා
16. ගරු බුද්ධික පතිරණ මහතා
17. ගරු ජයන්ත සමරවීර මහතා
18. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
19. ගරු වේලු කුමාර් මහතා (2022.11.19 දින සිට)
20. ගරු හේෂා විතානගේ මහතා
21. ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා
22. ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
23. ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
24. ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා (2022.10.17 දින දක්වා)
    ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා (2022.10.18 දින සිට)
25. ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
26. ගරු ඩී. වීරසිංහ මහතා
27. ගරු වීරසුමන වීරසිංහ මහතා
28. ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
29. ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

**නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය**
**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය**

**(වාර්තාවේ ඇතුළත් විමර්ශන කාල සීමාවේදී)**

1. ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා (සභාපති)
2. ගරු උදය ගම්මන්පිල මහතා
3. ගරු දුමින්ද දිසානායක මහතා
4. ගරු දයාසිරි ජයසේකර මහතා
5. ගරු ලසන්ත අලගියවන්න මහතා
6. ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
7. ගරු ශෙහාන් සේමසිංහ මහතා
8. ගරු ප්‍රසන්න රණවීර මහතා
9. ගරු තිස්ස අත්තනායක මහතා
10. ගරු හරීන් ප්‍රනාන්දු මහතා
11. ගරු නිරෝෂන් පෙරේරා මහතා
12. ගරු අශෝක් අබේසිංහ මහතා
13. ගරු බුද්ධික පතිරණ මහතා
14. ගරු කේ. කාදර් මස්තාන් මහතා
15. ගරු මොහමඩ් මුසම්මිල් මහතා
16. ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
17. ගරු හේෂා විතානගේ මහතා
18. ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
19. ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා
20. ගරු වීරසුමන වීරසිංහ මහතා
21. ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා
22. ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

## කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය:

- සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) / කාරක සභා ලේකම් - අනුෂා සී.පී. සූරියප්පෙරුම මිය
- ප්‍රධාන නිලධාරි - චින්තා එම්.බුලත්සිංහල මිය
- සහකාර ප්‍රධාන නිලධාරි - කේ.එම්.ජී.කේ.ජයවර්ධන මයා
- පාර්ලිමේන්තු නිලධාරි - ජේ.එම්.එස්.නිර්මාණී මිය
- පාර්ලිමේන්තු නිලධාරි - ජී.කේ.සී.තිලකරත්න මෙය
- පාර්ලිමේන්තු නිලධාරි - එච්.එම්.ඩී.ලක්මාලි මෙය
- පාර්ලිමේන්තු නිලධාරි - එම්.එස්.බන්දුලහේවා මිය
- පාර්ලිමේන්තු නිලධාරි - ජී.ඩී.ජේ.එච්.අයේෂ්මන්ති මෙය

## කාරක සභා වාර්තා බාගත කිරීම

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා/ ප්‍රකාශන බා ගත කර ගැනීමට හැකිය.

www.parliament.lk → සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි (තෝරන්න) → පාර්ලිමේන්තුවේ කටයුතු කාරක සභා → කාරක සභා වාර්තා → ව්‍යවස්ථාදායකය (තෝරන්න) → සභා වාරය (තෝරන්න) → කාරක සභා වර්ගය (විශේෂ කාර්යයන් සඳහා වන කාරක සභා) → කාරක සභාව (රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව) → වාර්තාව සොයන්න

## අදාළ විගණන වාර්තාව බාගත කිරීම

මේ පිළිබඳව විගණකාධිපති විසින් සිදු කරන ලද විමර්ශනය පිළිබඳ වාර්තාව පහත සඳහන් මාර්ගය ඔස්සේ ජාතික විගණන කාර්යාලයේ වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක.

www.national audit office.lk → Find Audit Report → Select Year (2022) → Select Audit Type (Special) → Select Sector (Special Report)

# පටුන

**පිටු අංකය**

(අ) සභාපතිවරයාගේ සටහන.......................................................................9

(ආ) පසුබිම .......................................................................................11

(ඇ) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පවත්වන ලද විමර්ශන පිළිබඳ තොරතුරු.......................................................................................12

(ඈ) විගණකාධිපති වාර්තාවේ සඳහන් නිරීක්ෂණ .......................................13

(ඉ) සාකච්ඡා කළ ප්‍රධාන කරුණු..........................................................15

(ඊ) කාරක සභාවේ නිරීක්ෂණ ..............................................................19

(උ) කාරක සභාවේ නිර්දේශ.................................................................20

(ඌ) කාරක සභාවේ නියෝග ..................................................................22

(එ) විමර්ශනයේ අවසන් තීරණය හා වර්තමාන තත්ත්වය ..............................24

(ඒ) ඇමුණුම් ......................................................................................I - XV

1. මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් එවා ඇති පිළිතුර ................... I - VIII
2. ජනාධිපති ලේකම් විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත එවන ලද අදාළ නියෝගය ඇතුළත් ලිපියේ පිටපත ........................................IX - X
3. ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් එවා ඇති පිළිතුර…. XI - XV

## සභාපතිවරයාගේ සටහන

සීනි කිලෝ ග්‍රෑම් එකක් සඳහා පනවා තිබුණු විශේෂ භාණ්ඩ බදු රු.50 සිට ශත 25 දක්වා අඩු කිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට ලැබීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වූ විගණකාධිපතිවරයාගේ විශේෂ විගණන වාර්තාව සම්බන්ධයෙන් නව වැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයේ ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතාගේ සභාපතිත්වයෙන් පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනයක් පවත්වා තිබුණි.

ඒ අනුව විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ, නිර්දේශ හා එම වාර්තාව පදනම් කරගෙන නව වැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයේ පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පවත්වන ලද විමර්ශනවල තොරතුරුද ඇතුළත් වාර්තාව, නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය සඳහා වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ තෙවැනි වාර්තාව ලෙස ස්ථාවර නියෝග 119 (3) ප්‍රකාරව අද දින මම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරමි.

මෙම පරීක්ෂාව සඳහා මැදිහත් වූ නව වැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා ඇතුළු සාමාජික මන්ත්‍රීවරුන්ටත්, කාරක සභාවේ කාර්යභාරය වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායීව ඉටු කිරීම සඳහා ලබා දුන් සහයෝගය වෙනුවෙන් විගණකාධිපතිතුමා ඇතුළු ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන්ටත්, මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ට හා පාර්ලිමේන්තු මහ ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාවය පළ කරමි.

එසේම, මෙම සභාවාරය තුළ කාරක සභාවේ කටයුතු සාර්ථකව හා වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා කාරක සභික මන්ත්‍රීවරුන්ගේ කැපවීම, සහයෝගය හා අඛණ්ඩ සහභාගිත්වය වැඩි දුරටත් අපේක්ෂා කරමි.

කබීර් හෂීම්
සභාපති
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

## සීනි කිලෝ ග්‍රෑම් එකක් සඳහා පනවා තිබුණු විශේෂ භාණ්ඩ බදු රු.50 සිට ශත 25 දක්වා අඩු කිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට ලැබීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව

### පසුබිම

ජනතාවට සහනයක් ලබාදීමේ අරමුණින් සීනි සඳහා පනවා තිබුණු විශේෂ භාණ්ඩ බදු රු.50 සිට ශත 25 දක්වා අඩු කිරීමට 2020 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී රජය විසින් කටයුතු කරන ලදී. එලෙස සීනි සඳහා පනවා තිබූ බදු විශාල ලෙස අඩු කළද, වෙළෙඳපොළෙහි සීනි මිල ප්‍රමාණාත්මකව අඩු නොවීමත්, රජයට ලබාගත හැකිව තිබූ විශාල බදු ආදායමක් මෙම බදු අඩු කිරීම නිසා අහිමි වීමත්, මහා පරිමාණ සීනි ආනයනකරුවන් පිරිසක් විසින් විශාල බදු වාසියක් අත්කර ගැනීමත්, එමගින් විශාල ලාභයක් උපයා ගැනීමත් සම්බන්ධයෙන් පසුගිය කාලය පුරා රට තුළ මහත් ආන්දෝලනයක් ඇති විය.

එම කරුණු සැලකිල්ලට ගෙන මෙම බදු සංශෝධනය හේතුවෙන් රජයට සිදුවූ අලාභය පිළිබඳව වෝහාරික විගණනයක් සිදුකර වාර්තාවක් ලබා දෙන ලෙස විගණකාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කළ යුතු බවට එවකට පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙකු වූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඉල්ලීමක් ඉදිරිපත් කර තිබුණි. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපති අනුර ප්‍රියදර්ශන යාපා මහතා විසින් එම ඉල්ලීම, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපති මහාචාර්ය තිස්ස විතාරණ මහතා වෙත යොමු කරන ලදුව, ඔහු විසින් එම ඉල්ලීම විගණකාධිපතිවරයා වෙත යොමු කරන ලදී.

ඒ අනුව, විගණකාධිපතිවරයා විසින් සකස් කරන ලද උක්ත වාර්තාව 2022 අප්‍රේල් මස 07 වැනි දින පාර්ලිමේන්තුව හමුවේ සභාගත කරන ලද අතර, එම විගණන වාර්තාව පදනම් කර ගනිමින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් මෙම විමර්ශනය සිදු කරන ලදී.

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පවත්වන ලද විමර්ශන පිළිබඳ තොරතුරු

- පළමුවැනි රැස්වීම පවත්වන ලද දිනය - 2022.03.24

- දෙවැනි රැස්වීම පවත්වන ලද දිනය - 2022.06.21

**කැඳවන ලද ආයතන -**

- මුදල් අමාත්‍යාංශය
- වෙළෙඳ අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා රේගුව
- වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
- ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
- සී/ස ලංකා සතොස

## විගණකාධිපති වාර්තාවේ සඳහන් නිරීක්ෂණ

1. සීනි කිලෝග්‍රෑම් එකක් සඳහා වූ විශේෂ භාණ්ඩ බද්ද රු. 50 සිට ශත 25 දක්වා අඩු කිරීම හේතුවෙන් 2020 ඔක්තෝබර් 14 වැනි දින සිට 2021 පෙබරවාරි 28 වැනි දින දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් රජය විසින් රු. මිලියන 16,763 ක බදු ආදායමක් කැප කර තිබුණි.

2. සීනි කිලෝග්‍රෑම් එකක බද්ද රු.49.75 කින් අඩු වුවද, බදු අඩු කළ මාසයෙන් පසු මාස 03ක වෙළෙඳපොළෙහි පැවති සාමාන්‍ය මිල සලකා බැලීමේදී සීනි කිලෝග්‍රෑම් එකක මිල අඩුවීම රු.18/-ක් පමණ විය.

3. බදු අඩු කිරීමෙන් පසු සාමාන්‍ය මාසික සුදු සීනි ආනයනය 73% කින්ද, දුඹුරු සීනි ආනයනය 235% කින්ද ඉහළ ගොස් තිබුණි.

4. විගණනයට බඳුන් වූ කාලසීමාව තුළ සමස්ත සුදු සීනි ආනයනයෙන් 45%ක් "පිරමිඩ් විල්මා පුද්ගලික සමාගම" විසින් ආනයනය කර තිබුණි. එම සමාගමේ ආනයනික ප්‍රමාණය 1,222% කින් වර්ධනය වී තිබුණු අතර රු. 6,229,025,820/- ක බදු වාසියක් බදු ගෙවන අවස්ථාවේදී හිමිවී තිබුණි.

5. බදු අඩු කිරීමට පෙර "පිරමිඩ් විල්මා පුද්ගලික සමාගම" විසින් ආනයනය කර බන්ධිත ගුදම්වල රඳවා තිබූ සීනි මෙට්‍රික් ටොන් 7,468ක්, බදු අඩු කළ දිනයේදීම කිලෝවකට ශත 25 බැගින් බදු ගෙවා ඉවත් කර ගෙන තිබූ අතර එමගින් එක් දිනක් තුළ එම සමාගමට රු. මිලියන 378ක පමණ බදු වාසියක් හිමිව තිබුණි.

6. බදු අඩු කිරීමෙන් පසු සීනි සඳහා රු.80/-ක පාලන මිලක් නියම කළද, 2020 ඔක්තෝබර් මාසයේ සිට 2021 පෙබරවාරි මාසය දක්වා වෙළෙඳපොළ තුළ සීනි මිල රු.90/- සිට රු.101/- දක්වා ක්‍රම ක්‍රමයෙන් වැඩිවී තිබුණි.

7. තොග වෙළෙන්දන් හා ආනයනකරුවන් පාලන මිල ඉක්මවා සීනි අලෙවි කරන්නේද යන්න පිළිබඳව සොයා බැලීමට වැටලීම් සිදුකර නොතිබුණි.

8. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් සියලුම ඉල්ලුම්කරුවන්ට ඔවුන් ඉල්ලුම් කළ සියලු තොගයන් ආනයනය කිරීමට අනුමැතිය ලබාදීම නිසා, බලපත්‍ර නිකුත් කිරීම මගින් රජය අපේක්ෂා කළ ආනයන සීමා කිරීමේ හෝ විනිමය ගලායාම පාලනය කිරීමේ අරමුණු නිසි පරිදි ඉටු වී නොතිබුණි.

9. සීනි ආනයනය සඳහා බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දී තිබුණද එය ක්‍රියාත්මක කිරීම දින 18ක් යනතුරු ප්‍රමාද කර තිබුණි. එම කාල පරිච්ඡේදය තුළ සීනි මෙට්‍රික් ටොන් 101,527ක් බලපත්‍ර නොමැතිව ආනයනය කර තිබුණි.

10. බලපත්‍ර නොමැතිව ආනයනය කරන ලද භාණ්ඩ වෙනුවෙන් අය කළ යුතු වූ 5% ක අතිරේක ගාස්තුව ආනයන හා අපනයන පාලක ජනරාල් සිය අභිමතය පරිදි 2%ක් දක්වා අඩු කර අය කිරීමෙන් රජයට රු. මිලියන 433ක පමණ මුදලක් අහිමිවී තිබුණි.

11. සීනි ආනයනය සීමා කිරීමේ අරමුණින් ආනයන බලපත්‍ර ක්‍රමය හඳුන්වා දුන්නද ඉන්පසු සීනි ආනයනය 47% කින් පමණ වැඩි වී තිබුණි.

12. මෙම බදු සංශෝධනයෙන් පසු සීනි අලෙවියට අදාළව සී/ස ලංකා සතොසට සිදුවූ අලාභය රු. මිලියන 102ක් පමණ විය.

13. ජනතාවට සහනයක් සැලසීමේ අරමුණෙන් රජය විසින් අදාළ බදු සංශෝධනය සිදු කළද, රජය කැප කළ ආදායම ප්‍රමාණවත් ලෙස ජනතාවට විතැන් වී නොතිබුණි.

## <u>සාකච්ඡා කළ ප්‍රධාන කරුණු</u>

1. සීනි සඳහා පනවා තිබූ බදු අඩු කිරීමේ රජයේ තීරණය ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය නිලධාරීන් අතින් කිසියම් වරදක් හෝ ප්‍රමාද දෝෂයක් සිදුවීද?

මේ පිළිබඳව කරුණු දැක්වූ මුදල් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) සඳහන් කළේ රජය විසින් බදු අඩු කිරීමේ තීරණය ගනු ලැබුවේ පාරිභෝගික ජනතාවට සහනයක් ලබා දීමේ පරමාර්ථයෙන් බවත්, රජයේ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම වන බවත්ය. රජයේ අරමුණ 100% කින් ඉටුවී නොමැති වුවත්, යම් ප්‍රමාණයක සහනයක් පාරිභෝගික ජනතාවට ලැබී ඇති බවත්, නිලධාරීන් අතින් වරදක් සිදුවී නොමැති බවත් ඔහු වැඩි දුරටත් සඳහන් කරන ලදී.

2. බදු අඩුවීමට සාපේක්ෂව වෙළෙඳපොළේ සීනි මිල අඩු නොවීම

විගණකාධිපතිවරයාගේ වාර්තාවට අනුව 2020 නොවැම්බර් මාසය වනවිට සීනි කිලෝවක් පාරිභෝගිකයාට විකිණිය හැකිව තිබූ මිල රු.91.88ක් වුවත්, වෙළෙඳපොළ තුළ පැවති මිල රු.123.45 ක් විය. ඒ අනුව ව්‍යාපාරිකයින් විසින් අධික ලාභයක් ලබාගෙන තිබෙන බව ඉතා පැහැදිලිව පෙනී යන බව කාරක සභාව අවධාරණය කළේය.

මේ පිළිබඳව අදහස් දක්වමින් මුදල් අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. කියා සිටියේ සීනි සඳහා ඇත්තේ කතිපයාධිකාරී වෙළෙඳපොළක් (Oligopolistic Market) බවත්, එම වෙළෙඳපොලේ හැසිරීම අනුව බදු අඩුවීමේ වාසිය 100% කින් පාරිභෝගිකයාට නොලැබුණ ද, ක්‍රමානුකූලව යම් ප්‍රමාණයකින් සීනි මිල අඩුවී ඇති බවත් ය.

3. බදු අඩු කිරීම මගින් රජය අපේක්ෂා කළ සහනය ජනතාවට නොලැබුණු බැවින් රජය කැප කළ බදු ආදායම තම අත රඳවාගත් පාර්ශ්වයන්ගෙන් නැවත අයකර ගැනීමේ හැකියාව සොයා බැලීම.

මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඇති හැකියාව පිළිබඳව නීතිපති උපදෙස් ලබා ගැනීමට බලාපොරොත්තු වන බව මුදල් අමාත්‍යාංශයේ ගණන් දීමේ නිලධාරී (ග.නි.) ප්‍රකාශ කළේය.

4. තීරුබදු නිර්ණය කිරීමේ කමිටුව (Tariff Determination Committee) පත් කරන ලද්දේ කවුරුන් විසින්ද? එහි සාමාජිකයින් සහ ඔවුන්ගේ බලතල

මෙම කමිටුව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද බවත්, ජනාධිපති ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් එම කමිටුවේ සෙසු සාමාජිකයන් ලෙස ආනයන හා අපනයන පාලක ජනරාල්, රේගු අධ්‍යක්ෂ ජනරාල්, වාණිජ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු නිලධාරීන් කීපදෙනෙකු කටයුතු කරන බවත් මුදල් අමාත්‍යාංශයේ ග.නි සඳහන් කළේය.

5. මෙම බදු සංශෝධනයට අදාළ යෝජනාව වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට යොමු කර එහි බලපෑම පිළිබඳ පරීක්ෂා කර නොබැලීම.

බාහිර පාර්ශ්වයන්ගෙන් ඉදිරිපත් වන එවැනි යෝජනා තම දෙපාර්තමේන්තුව මගින් විමර්ශනය කර අදාළ නිර්දේශ ලබා දෙන බව වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය. ජනාධිපතිවරයාගෙන් ලැබෙන නියෝග ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම දිගින් දිගටම පැවති ක්‍රමවේදය (Practice) බවත් ඔහු සඳහන් කළේය.

සීනි සඳහා වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අඩු කිරීමේ නියෝගය 2020 ඔක්තෝබර් මස 13 දින ලැබුණු බවත්, එය එදින මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක කළ යුතුව තිබූ බැවින් ඒ පිළිබඳව විමර්ශනයක් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබූ බවත් ඔහු ප්‍රකාශ කළේය.

(ජනාධිපති ලේකම් විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත එවන ලද අදාළ නියෝගය ඇතුළත් ලිපියේ පිටපත - ඇමුණුම අංක 02 හි පිටු අංක IX)

6. සීනි බදු අඩු කිරීමෙන් රජයට සිදු වූ ආදායම් අහිමි වීමට අදාළව පහත කරුණු පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් විමර්ශනයක් සිදු කළ යුතු බව

• බදු අඩු කරන අවස්ථාව වන විට බන්ධිත ගුදම්වල තිබූ සීනි ප්‍රමාණය පිළිබඳ සැලකිල්ලක් නොදැක්වීම තුළින් රජයට සිදුවූ අලාභයට වගකිව යුතු ආයතන හා නිලධාරීන් කවුරුන් ද?

• බදු අඩු කිරීමෙන් අනතුරුව කෙටි කාල සීමාවක් තුළ බන්ධිත ගුදම් වල තිබූ සීනි තොග කිලෝ ග්‍රෑමයට සත 25 බැගින් බදු ගෙවා රේගුවෙන් නිදහස් කර ගැනීමෙන් අයථා ලෙස ලාභ ඉපයූ සමාගම් වලින් එම මුදල් ආපසු අය කර ගැනීමට හැකියාවක් තිබේ ද?

• වරායේ නැංගුරම් ලා තිබූ නැව්වල තිබූ සීනි තොග බදු අඩු කරන තෙක් හිතාමතා ගොඩ බෑමෙන් වැළකී සිටියේ ද?

7. බදු පැනවීම හා මිල පාලනය සඳහා කමිටුවක් ස්ථාපිත කිරීම

2015 – 2019 කාල සීමාව තුළ ජීවන වියදම් කමිටුව මගින් මිල පාලනය සම්බන්ධ තීරණ ගැනීම සිදු කළ බව පෙන්වා දුන් කාරක සභාව, බදු පැනවීම් සහ භාණ්ඩ මිල පාලනය සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා විධිමත් කමිටුවක් නොමැති වීම බලවත් අඩුපාඩුවක් බව අවධාරණය කළේය.

8. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වගකීම පැහැර හැරීම

මහා පරිමාණ ආනයනකරුවන්ගේ කටයුතු පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් නිසි අවධානය යොමු නොකොට සිල්ලර වෙළෙඳුන් පමණක් පරීක්ෂා කිරීම තුළින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සිය වගකීම පැහැර හැර ඇති බව කාරක සභාව හමුවේ අනාවරණය විය. එමෙන්ම ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කිරීමේදී නිසි ක්‍රමවේදයෙන් බැහැරව කටයුතු කිරීම නිසා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් මෑතකදී නිකුත් කරන ලද ගැසට් පත්‍ර කීපයක් අවලංගු කිරීමට සිදු වූ බවද කාරක සභාව ප්‍රකාශ කළේය. ඒ පිළිබඳව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, කාරක සභාවේ දැඩි දෝෂ දර්ශනයට ලක් විය.

9. බදු ප්‍රතිපත්තිය තීරණය කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කිරීම.

සීනි බදු අඩු කිරීම තුළින් 2020 වර්ෂයේ රු. මිලියන 21,000 ක් වූ රජයේ බදු ආදායම 2021 වර්ෂයේ රු. මිලියන 138 ක් දක්වා විශාල ප්‍රමාණයකින් පහත වැටුණු බව කාරක සභාව හමුවේ අනාවරණය විය. බදු ප්‍රතිපත්තිය තීරණය කිරීමේදී විධිමත් වැඩපිළිවෙළක් නොමැතිවීම හා ඊට සම්බන්ධ ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් නොමැතිවීම නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇති බව කාරක සභාව අවධාරණය කළේය.

10. සීනි ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම ප්‍රමාදවීම සහ බලපත්‍ර නොමැතිව ආනයනය කරන ලද භාණ්ඩ සඳහා අය කළ යුතු අතිරේක ගාස්තුව ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් සිය අභිමතය පරිදි 2% දක්වා අඩු කිරීම.

සීනි සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ගැසට් නිවේදනය 2020 ඔක්තෝබර් 29 දින නිකුත් කර තිබුණද, බලපත්‍ර නිකුත් කිරීම ආරම්භ කිරීම 2020 නොවැම්බර් 18 වැනි දින දක්වා ප්‍රමාද වීමට හේතු සහ බලපත්‍ර නොමැතිව භාණ්ඩ ආනයනය කිරීමේදී අය කළ යුතු 5% ක් වූ අතිරේක ගාස්තුව ආනයන හා අපනයන පාලක ජනරාල්වරිය සිය අභිමතය පරිදි 2% දක්වා අඩු කිරීමෙන් රජයට රු. මිලියන 433 ක පමණ අලාභයක් සිදුවී ඇති බැවින් එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට හේතු වූ කරුණු පිළිබඳව කාරක සභාව විමසීමක් කළේය.

මේ පිළිබඳව කරුණු දක්වමින් ආනයන හා අපනයන පාලක ජනරාල් සඳහන් කළේ යම් කිසි භාණ්ඩයක් ආනයනය පාලනයට යටත් කිරීමේදී එම විෂයට අදාළ අමාත්‍යාංශයෙන් පාලන ක්‍රමවේදය පිළිබඳ යෝජනා/ නිර්ණායක ඉදිරිපත් කළ යුතු බවයි. ඒ අනුව වෙළෙඳ අමාත්‍යාංශයෙන් සහ උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් සීනි ආනයනය නියාමනය කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර දෙන ලෙස ඉල්ලා සිටි බවත්, අදාළ නිර්දේශ ලැබෙන තෙක් බලපත්‍ර නිකුත් කිරීම ප්‍රමාද කිරීමට සිදු වූ බවත් ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් සඳහන් කරන ලදී.

ඒ අනුව, 2020.10.30 සිට 2020.11.18 දක්වා කාලය තුළ බලපත්‍ර නිකුත් නොකළ බැවින් එම කාල සීමාව තුළ සීනි ආනයනය කළ ආනයනකරුවන්ගෙන් ඉදිරිපත් වූ ඉල්ලීම් පිළිබඳව ද, බලපත්‍ර ගාස්තුවට අතිරේකව අය කරන මුදල ද ආනයනකරුවන් විසින් භාණ්ඩ මිලට එකතු කිරීම නිසා මිල ඉහළ යාමෙන් පාරිභෝගිකයාට සිදුවන අපහසුතා පිළිබඳව ද අවධානය යොමු කර, 2020.10.30 දින සිට 2020.11.18 දින දක්වා ආනයනය කරන ලද සීනි සඳහා අතිරේක ගාස්තුව 2% දක්වා අඩු කිරීමට තීරණය කළ බව ආනයන හා අපනයන පාලක ජනරාල් කාරක සභාව හමුවේ සඳහන් කළාය.

ආනයන හා අපනයන පාලන පනත යටතේ අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2016 පෙබරවාරි මස 11 වැනි දින නිකුත් කරන ලද අංක 1953/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ උපලේඛන iii හි, බලපත්‍රයක් නොමැතිව ආනයනය කිරීම් සඳහා 5% ක අතිරේක ගාස්තුවක් අය කළ යුතු බව දක්වා ඇති නමුත් එම ගාස්තුව ආනයන හා අපනයන පාලක ජනරාල්වරයාගේ අභිමතය පරිදි අවශ්‍යය අවස්ථාවන්හි සුදුසු පරිදි සංශෝධනය කළ හැකි බවටද අදාළ ගැසට් පත්‍රයේ

සඳහන්ව ඇතැයි ආනයන හා අපනයන පාලක ජනරාල් පෙන්වා දුන්නාය. එම ගැසට් පත්‍රයෙන් පැවරී ඇති බලතල අනුව අතිරේක ගාස්තුව අඩු කිරීමේ තීරණය ගන්නා ලද බව ඇය ප්‍රකාශ කළාය.

## 11. සීනි සඳහා පාලන මිලක් නියම කිරීම

ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකි මිලක් පාලන මිල ලෙස පැනවීම නිසා විවෘත වෙළෙඳපොළ තුළ පාලන මිලට සීනි අලෙවි නොවූ බව කාරක සභාව සඳහන් කළේය. එම නිසා සී/ස ලංකා සතොස මගින් විවෘත වෙළෙඳ පොළෙන් වැඩි මිලට සීනි මිලදී ගෙන පාලන මිලට විකිණීම තුළින් රු. මිලියන 102 ක පාඩුවක් සතොසට සිදු වූ බවද කාරක සභාව අනාවරණය කළේය.

## කාරක සභාවේ නිරීක්ෂණ

(1) රජය අපේක්ෂා කළ සහනය 100% කින්ම පාරිභෝගික ජනතාවට ලැබී නොමැති බවත්, රු.49.75 කින් බදු අඩු වුවත් පාරිභෝගිකයාට ලැබී ඇත්තේ රු.18/-ක පමණ සහනයක් බවත්, ඉතිරි ප්‍රමාණය ආනයනකරුවන්, තොග වෙළෙඳුන් සහ සිල්ලර වෙළෙඳුන් විසින් අඩු වැඩි වශයෙන් අත්පත් කර ගෙන ඇති බව.

(2) බදු සංශෝධනයට අදාළ ගැසට් නිවේදනය නිකුත් කරන අවස්ථාව වන විට බන්ධිත ගුදම්වල තිබූ සීනි මෙට්‍රික් ටොන් 7000 කට අධික සීනි ප්‍රමාණය පිළිබඳව සලකා නොබැලීම අදාළ නිලධාරීන් අතින් සිදුවූ අතපසුවීමක් බව හා එම සීනි ප්‍රමාණය බදු අඩු කළ දිනයේදී ම ඉවත් කර ගැනීම තුළින් එක් පෞද්ගලික සමාගමකට විශාල බදු වාසියක් හිමිවී ඇති බව.

(3) රට තුළ සාමාන්‍ය මාසික සීනි පරිභෝජනය මෙට්‍රික් ටොන් 50,000 – 55,000 ක් පමණ වුවත් මෙම බදු සංශෝධනයෙන් පසු සීනි ආනයනය මසකට මෙට්‍රික් ටොන් 80,000 – 90,000 දක්වා අසාමාන්‍ය ලෙස වැඩිවී ඇති බව.

(4) 2020 ඔක්තෝබර් මස 30 වැනි දින සිට සීනි ආනයනය සඳහා බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීමට රජය විසින් නියම කළද, එහි වගකීම පැවරී තිබූ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව එම තීරණය ක්‍රියාත්මක කිරීම 2020 නොවැම්බර් මස 18 වැනි දින තෙක් ප්‍රමාද කර ඇති බව.

(5) ආනයන බලපත්‍ර නිකුත් කිරීමේදී 5% ක අතිරේක ගාස්තුවක් අය කළ යුතු බවට වෙළෙඳ අමාත්‍යවරයාගේ 2016 පෙබරවාරි මස 11 වැනි දිනැති අංක 1953/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ iii වැනි උපලේඛනය මගින් නියම කර තිබුණ ද, ආනයන හා අපනයන පාලක ජනරාල් සිය අභිමතය පරිදි අතිරේක ගාස්තුව 2% ක් දක්වා අඩුකර අය කිරීමෙන් රජයට හිමි විය යුතුව තිබූ රු.433,120,147/- ක ආදායමක් අහිමි වී ඇති බව.

(6) ආනයන බලපත්‍ර ක්‍රමය හඳුන්වා දීමෙන් රජය අපේක්ෂා කළේ සීනි ආනයනය සීමා කිරීම වුවද, ඉල්ලුම් කළ සියලු දෙනාට බලපත්‍ර නිකුත් කිරීම නිසා පැවති ප්‍රමාණයට සාපේක්ෂව සීනි ආනයනය 47% කින් පමණ වැඩිවී ඇති බව.

(7) රජය විසින් සුදු සීනි සඳහා රු.85/-ක පාලන මිලක් නියම කළ ද, විවෘත වෙළෙඳපොළ තුළ පාලන මිල ඉක්මවා සීනි අලෙවි වී ඇති බව පාරිභෝගික සේවා අධිකාරියේ සහ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව පැහැදිලි වන බව

(8) සී/ස ලංකා සතොස මගින් විවෘත වෙළෙඳපොළෙන් වැඩි මිලට සීනි මිලදී ගෙන පාලන මිලට අලෙවි කිරීම තුළින් රු.47,000,000/- ක පමණ පාඩුවක් සිදුවී ඇති බව.

## කාරක සභාවේ නිර්දේශ

1. බදු සංශෝධනයකදී අදාළ ආයතන අතර මනා සම්බන්ධතාවයක් තිබිය යුතු බව

2. පාලන මිලක් නියම කිරීමේදී වෙළෙඳපොළ පිළිබඳව හොඳින් අධ්‍යයනය කර එය සිදු කළ යුතු බව

3. පාලන මිල ක්‍රියාත්මක කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කළ යුතු බව

4. ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කර ඇති යම් කරුණක් සංශෝධනය කරන විට එම සංශෝධනය පිළිබඳවද ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතු බව (උදා: ගැසට් නිවේදනයක් මගින්, බලපත්‍ර නොමැතිව ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා පනවා තිබුණු 5% ක් වූ අතිරේක ගාස්තුව 2% දක්වා අඩු කිරීමද ගැසට් නිවේදනයක් මගින්ම සිදු කළ යුතු බව)

5. අමාත්‍යවරයාගේ නියෝගයක් පහළ නිලධාරියෙකු විසින් සංශෝධනය කිරීම සුදුසු තත්ත්වයක් නොවන බව සහ එය වැරදි පූර්වාදර්ශයක් විය හැකි බව

6. බදු අඩු කිරීමේ වාසිය ජනතාවට නිසියාකාරව විතැන් නොවූ බැවින් එම බදු වාසිය තම අත රඳවාගත් පාර්ශ්වයන්ගෙන් නැවත රජයට අයකර ගැනීමේ හැකියාව පිළිබඳව නීති උපදෙස් ලබා ගැනීම ප්‍රමාදවී ඇති බැවින් ඒ සඳහා කඩිනමින් අවශ්‍ය කටයුතු කළ යුතු බව.

7. ජනාධිපතිවරයාගෙන් වුවද නියෝගයක් ලද විට, එම නියෝගය ක්‍රියාත්මක කිරීමෙන් පසු ඇති විය හැකි බලපෑම පිළිබඳ සමාලෝචනය කොට එහි යහපත්/ අයහපත් ප්‍රතිඵල පිළිබඳ අදාළ බලධාරීන් දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් සැකසිය යුතු බව.

8. තීරු බදු නිර්ණය කිරීමේ කමිටුව (Tariff Determination Committee) නීත්‍යානුකූල කිරීමට කටයුතු කිරීම.

9. ජීවන වියදම් කමිටුව යළි සක්‍රිය කිරීම.

10. දැනට බලපැවැත්වෙන පාරිභෝගික සේවා අධිකාරි පනතෙහි ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන්නේ නම් වර්තමානයට ගැලපෙන ආකාරයට පනත සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු බව.

11. භාණ්ඩයක් සඳහා බදු නිර්ණය කිරීමේ දී මෙන්ම මිල තීරණය කිරීමේ දී රට තුළ පවතින භාණ්ඩ තොග ප්‍රමාණය, බන්ධිත ගුදම්වල පවතින ප්‍රමාණය ආදී තොරතුරු සමාලෝචනය කළ යුතු බව හා ඊට අදාළ දත්ත රැස් කර තබාගැනීම සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කළ යුතු බව.

12. ගැසට් පත්‍රයක් මගින් පනවා ඇති බදු/ ගාස්තු වෙනස් කිරීමක් සිදු කරන්නේ නම් එය ගැසට් නිවේදනයක් මගින් ම සිදු කළ යුතු බව.

13. බලපත්‍ර නොමැතිව ආනයනය කිරීමේදී අය කළ යුතු අතිරේක ගාස්තුව ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් 5% සිට 2% දක්වා අඩු කිරීම තුළින් රජයට අහිමි වූ රු. මිලියන 433 ක මුදල නැවත අයකර ගැනීමට ඇති හැකියාව සොයා බැලීම.

14. විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති ආයතන විසින් ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කර එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා එහි ප්‍රගතිය කාරක සභාවට දැනුම් දීම.

15. මහා පරිමාණ ආනයනකරුවන් සහ තොග වෙළෙඳුන් පරීක්ෂා නොකොට කුඩා සිල්ලර වෙළෙඳුන් පමණක් පරීක්ෂා කිරීම තුළින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සිය වගකීම නිසි ලෙස ඉටු කර නොමැති බව.

## කාරක සභාවේ නියෝග

1. සීනි බදු අඩු කිරීමෙන් රජයට ලැබිය යුතුව තිබූ ආදායම් අහිමිවීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්ව හඳුනා ගැනීම සහ මෙම බදු අඩු කිරීමෙන් අයථා ලෙස බදු වාසි අත්පත් කරගත් පාර්ශ්වයන්ගෙන් එම මුදල් නැවත රජයට අයකර ගැනීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පූර්ණ විමර්ශනයක් සිදුකිරීම.

❖ **<u>නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති නිලධාරීන් හා ආයතන</u>**

ලේකම් - මුදල් අමාත්‍යාංශය

2. බදු සංශෝධන හා මිල පාලනය සම්බන්ධ තීරණ ගැනීම සඳහා අදාළ සියලුම ආයතන ඇතුළත් වන පරිදි විධිමත් කමිටුවක් ස්ථාපිත කිරීම.

❖ **<u>නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති නිලධාරීන් හා ආයතන</u>**

ලේකම් - මුදල් අමාත්‍යාංශය
ලේකම් - වෙළෙඳ අමාත්‍යාංශය
අධ්‍යක්ෂ ජනරාල් - වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
පාලක ජනරාල් - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
සභාපති - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා රේගුව

3. භාණ්ඩයක බදු හා මිල තීරණය කිරීමේදී සලකා බැලිය යුතු තොරතුරු හා දත්ත පහසුවෙන් ලබාගැනීම සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කිරීම.

❖ **<u>නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති නිලධාරීන් හා ආයතන</u>**

ලේකම් - මුදල් අමාත්‍යාංශය
ලේකම් - වෙළෙඳ අමාත්‍යාංශය
අධ්‍යක්ෂ ජනරාල් - වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
පාලක ජනරාල් - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
සභාපති - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා රේගුව

4. විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ හා නිර්දේශ සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

❖ **<u>නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති නිලධාරීන් හා ආයතන</u>**

ලේකම් - මුදල් අමාත්‍යාංශය

(මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් එවා ඇති පිළිතුර, ඇමුණුම් අංක 01 හි පිටු අංක I – VIII දක්වා)

5. සී/ස ලංකා සතොස ආයතනය මගින් විවෘත වෙළෙඳ පොළෙන් වැඩි මිලට භාණ්ඩ මිලදී ගෙන පාලන මිලට අලෙවි කිරීම තුළින් සිදුවන අලාභය අවම කර ගැනීම සඳහා සී/ස ලංකා සතොස මගින් අත්‍යවශ්‍ය භාණ්ඩ සෘජුව ආනයනය කිරීමේ හැකියාව සොයා බැලීම.

❖ **<u>නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති නිලධාරීන් හා ආයතන</u>**

ලේකම් - මුදල් අමාත්‍යාංශය
ලේකම් - වෙළෙඳ අමාත්‍යාංශය
සභාපති - සී/ස ලංකා සතොස

6. බලපත්‍ර නොමැතිව ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා අය කළ යුතු 5% ක අතිරේක ගාස්තුව සිය අභිමතය පරිදි 2% දක්වා අඩු කිරීමෙන් රජයට අහිමි වූ ආදායම හා එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට හේතු ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

❖ **<u>නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති නිලධාරීන් හා ආයතන</u>**

ලේකම් - මුදල් අමාත්‍යාංශය
පාලක ජනරාල් - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

(ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් එවා ඇති පිළිතුර, ඇමුණුම් අංක 03 හි පිටු අංක XI - XV දක්වා)

7. විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ හා නිර්දේශ අදාළ ආයතන මගින් ක්‍රියාත්මක කොට එහි ප්‍රගතිය මාස 3 ක කාලයකින් කාරක සභාව හමුවට ඉදිරිපත් කිරීම.

❖ **<u>නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති නිලධාරීන් හා ආයතන</u>**

ලේකම් - මුදල් අමාත්‍යාංශය
ලේකම් - වෙළෙඳ අමාත්‍යාංශය
පාලක ජනරාල් - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
සභාපති - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා රේගුව
සභාපති - සී/ස ලංකා සතොස

## විමර්ශනයේ අවසන් තීරණය හා වර්තමාන තත්ත්වය

2022 ජූනි මස 21 වැනි දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත කාරක සභාව විසින් කරන ලද නියෝගය අනුව අදාළ බදු අඩු කිරීම නිසා රජයට හිමි විය යුතුව තිබූ ආදායම් නොලැබී යාමට වගකිව යුතු පාර්ශ්ව හඳුනා ගැනීම සහ මෙම බදු අඩු කිරීමෙන් අයථා ලෙස බදු වාසි අත්පත් කරගත් පාර්ශ්වයන්ගෙන් එම මුදල් නැවත රජයට අයකර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා පූර්ණ විමර්ශනයක් පැවැත්වීමට මුදල් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් මෙම සිදුවීම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇත.

ඒ අනුව, මෙම සිදුවීම සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් මේ වනවිට ආරම්භ කර ඇති බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත.

ඇමුණුම 01

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE


මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: TIP/TP/01/10 (T 4) Vol 1
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2022.04.25

ලේකම්
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

**සීනි කිලෝ ග්‍රෑම් එකක් සඳහා පනවා තිබුණු විශේෂ වෙළඳ භාණ්ඩ බදු රු. 50 සිට ශත 25 දක්වා අඩුකිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට ලැබීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් යොමුකර ඇති අංක රා.ගි.කා.ස. /9/2/2022 සහ 2022 මාර්තු මස 28 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුලත් නිර්දේශ (වාර්තාවේ අංක 07 යටතේ ඇති) සහ නිරීක්ෂණ (වාර්තාවේ අංක 06 යටතේ ඇති) සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ යුතු වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමුකිරීම සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි.

**ආර්. එම්. පී. රත්නායක**
**වැඩබලන ලේකම්**
**මුදල් අමාත්‍යාංශය**

**2022.03.24 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදුන් නියෝග පරිදි, සීනි කිලෝ ග්‍රෑම් එකක් සඳහා පනවා තිබුණු විශේෂ වෙළඳ භාණ්ඩ බදු රු. 50 සිට ශත 25 දක්වා අඩුකිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට ලැබීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරණු ලබන වාර්තාව**

---

ඉහත කරුණ සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ලේකම් විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකර ඇති අංක රා.ගි.කා.ස. /9/2/2022 සහ 2022 මාර්තු මස 28 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව, විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුලත් **නිර්දේශ** (වාර්ථාවේ අංක 07 යටතේ ඇති) සහ **නිරීක්ෂණ** (වාර්ථාවේ අංක 06 යටතේ ඇති) සම්බන්ධයෙන් වාර්ථාවක් මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමුකළ යුතුව ඇති බැවින්, ඒ සඳහා පහත කරුණු ඉදිරිපත් කර ඇත.

**විගණන වාර්තාවේ නිර්දේශ - අංක (07)**

| අනු අංක | මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන කරුණු |
|---|---|
| 7.1 | මෙහිදී අදාළ බදු සහනය ඉදිරියේදී ජනතාව වෙත ලබාදීම ප්‍රායෝගිකව සිදුකළ නොහැකි බැවින්, ඒ සඳහා අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඇති හැකියාව පිළිබඳව නීතිපති උපදෙස් ලබාගැනීමෙන් අනතුරුව රජය කැපකළ බදු ආදායම තම අත රඳවාගත් පාර්ශවයන්ගෙන් ලබාගැනීම සඳහා කටයුතු කිරීමට එකඟවෙමි.<br>මේ සම්බන්ධයෙන්,<br>(i) 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු අධිකාරී පනතේ 7 වන සහ 8 වන වගන්ති යටතේ කටයුතු කිරීම සහ<br>(ii) ඉදිරියේදී මෙවැනි ආකාරයෙන් දේශීය වෙළදාමේදී පාරිභෝගිකයාට ලැබිය යුතු සහනය ලබානොදෙන විට, ඒ සඳහා දේශීය ආදායම් පනත යටතේ අවශ්‍ය සංශෝධනයන් සිදුකර ගතහැකි ක්‍රියාමාර්ග සොයා බැලීම සුදුසු වේ. |
| 7.2 | මෙම කාලයේදී බදු සංශෝධනයන් සම්බන්ධ තීරණයන් ගැනීම ප්‍රධාන වශයෙන් සිදුකරන ලද්දේ අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කළ, ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් Tariff Determination Committee මගිනි. කෙසේ වූවද, මෙම අවස්ථාවේදී අදාළ භාණ්ඩ 04 සඳහා බදු අඩුකිරීමට අදාල තීරණය ජනාධිපතිතුමාගේ උපදෙස් මත ගැනීමෙන් අනතුරුව, එය ක්‍රියාත්මක කිරීම සඳහා පසුව මුදල් අමාත්‍යාංශය දැනුවත් කිරීම ජනාධිපතිතුමාගේ ලේකම් විසින් 2020.10.13 දිනැති ලිපිය **(ඇමුණුම 3)**මගින් සිදුකර ඇත. ඒ අනුව අදාල තිරණය වහාම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මත මුදල් අමාත්‍යතුමාගේ ද එකඟතාවය අනුව අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |
| 7.3 | මේ සම්බන්ධයෙන් ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ඉදිරිපත්කර ඇති අංක ICED/3/2020/2 සහ 2020.04.07 දිනැති ලිපියේ **(ඇමුණුම 5)** කරුණු ඉදිරිපත් කර ඇත. |
| 7.4 | පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම අපේක්ෂා කෙරේ. |

| | |
|---|---|
| 7.5 | පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම අපේක්ෂා කෙරේ. |
| 7.6 | පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් මේ සම්බන්ධයෙන් දැනට කරනු ලබන කාර්යයන් අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු වේ. |
| 7.7 | වෙළඳ අමාත්‍යාංශය සහ ලංකා සතොස ආයතනය විසින් අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම අපේක්ෂා කෙරේ. |
| 7.8 | පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම අපේක්ෂා කෙරේ. |
| 7.9 | පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් මේ සම්බන්ධයෙන් දැනට කරනු ලබන කාර්යයන් අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු වේ. |
| 7.10 | බදු පැනවීමේදී මේ සම්බන්ධයෙන් දැනටමත් කටයුතු කරන අතර, පාලන මිල සහ මිල නියාමනය සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් මේ සම්බන්ධයෙන් දැනට කරනු ලබන කාර්යයන් අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු වේ. |
| 7.11 | මේ සම්බන්ධයෙන් ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ඉදිරිපත්කර ඇති අංක ICED/3/2020/2 සහ 2020.04.07 දිනැති ලිපියේ **(ඇමුණුම 5)** කරුණු ඉදිරිපත් කර ඇත. |
| 7.12 | දේශීය දුඹුරු සීනි නිෂ්පාදනය සඳහා වැයවන පිරිවැය පිළිබඳව ද අවධානය යොමුකර අදාල අමාත්‍යාංශයේ එකඟතාව මත, ඒ සඳහා පාලන මිලක් පැනවීම දේශීය සීනි නිෂ්පාදන කර්මාන්තයේ ඉදිරි සංවර්ධනය සඳහා බාධාවක් වියහැකිද යන්න අධ්‍යනය කළ යුතුය. |

## විගණන වාර්තාවේ නිරීක්ෂණ - අංක (06)

| **විගණන වාර්තාවේ නිරීක්ෂණ අනු අංක** | **මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ** |
|---|---|
| 6.1 | මෙම කාලපරිච්ඡේදයේදී පැවති කොවිඩ් වසන්ගත තත්ත්වය හමුවේ ජනතාව වෙත හැකි අයුරින් සහනයන් ලබාදීමේ රාජ්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට රජයේ අවධානය යොමු කර තිබුණි. විශේෂයෙන් නිරෝධායන කටයුතු නිසා රැකියා අවස්ථා අහිමිවීම් සැලකිල්ලට ගෙන ජනතාව වෙත සෘජුව මුල්‍ය අධාර කිරීමට (රු.5000ක දීමනාවක් ලබාදීම) පවා රජය මැදිහත් විය.<br><br>එවැනි වාතාවරණයක් තුළ, අතිගරු ජනාධිපතිතුමාගේ තීරණයක් පරිදි, ජනතාවට අත්‍යාවශ්‍ය භාණ්ඩ 04 ක පමණ (සීනි, පරිප්පු, ලොකු ළූනු සහ ටින් මාළු) බදු අඩුකිරීම සිදුකර ඇත.<br><br>මෙසේ සීනි සඳහා 2020.10.14 දින සිට ක්‍රියාත්මක සහනදායි ශත 25 ක් වූ බද්ද මේ වන විටත් ක්‍රියාත්මක වන අතර, ඒ අනුව 2020.10.14 සිට 2022.03.31 දින දක්වා (මාස 17.5 ක් තුළ ) සීනි මෙ. ටොන් 857,571 ක් ආනයනය කර ඇති අතර, එම ප්‍රමාණය සාමාන්‍ය මාසික අවශ්‍යතාවය වන මෙ. ටොන් 48,926 ක ප්‍රමාණය හා සැසඳිමේදි අසාමාන්‍ය ලෙස සීනි ආනයනය වීමක් මේ වන විට වාර්ථා නොකරයි. |

| | |
|---|---|
| | එමෙන්ම 2008 වර්ෂයේ සිට මේ දක්වා රජයේ ප්‍රතිපත්තිමය කරුණු මත ආනයනික සීනි සඳහා අදාළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වරින් වර සංශෝධනය කිරීම සිදුකර ඇත **(ඇමුණුම 1).** |
| 6.2 | 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ ඕනෑම ආනයනකරුවකුට පොදුවේ අදාළ වන පරිදි, (General Duty) 2020 ඔක්තෝබර් මස 13 දිනැති අංක 2197/12 දරන ගැසට් නිවේදනය මගින් සීනි, පරිප්පු, බොම්බයි ළූණු සහ වින්මාළු සඳහා ශත 25 ක බද්දක් ක්‍රියාත්මක කරන ලදී. එය තෝරාගත් ආනයනකරුවකු වෙත පමණක් බදු සහනයක් ලබාදීමට නිකුත්කළ නියෝගයක් නොවේ.<br>තවද, මෙම නියෝගය මගින් එක් ආනයනකරුවකුට ආනයනය කළ හැකි (Quota Restrictions) ප්‍රමාණයක් / සීමා කිරීමක් දක්වා නොමැත. මෙම පනත යටතේ තෝරාගත් ආයතනයකට පමණක් බදු වාසියක් ගෙන දීමට අවශ්‍ය නම්, එකී පනතේ 5 වන වගන්තිය යටතේ බදු සහනයක් (Duty Waiver) ලබාදීමට ඇති විධිවිධාන භාවිතයට ගත හැකිව තිබුණි.<br>මෙම අවස්ථාවේ දී පැවති සීනි මිල ඉහළයාම පාලනය කිරීමට ගතහැකි ක්‍රියාමාර්ගය වූයේ වෙළඳපලේ සීනි සැපයුම වැඩිකිරීමට කටයුතු කිරීමයි. මෙහිදී සීනි ආනයනයට රජයේ මැදිහත්වීමක් නොමැති පසුබිමක, පෞද්ගලික අංශයේ සීනි ආනයනකරුවන් ඒ ඒ ආනයනකරුවන්ගේ හැකියාව මත සීනි තොග ආනයනය කර ඇති අතර, ඒ අනුව ඔවුන් ලබා ඇති බදු වාසිය ප්‍රමාණාත්මක විචලනයන්ට ලක්වීම සිදුවී ඇත. |
| 6.3 | මේ අවස්ථාවේ සීනි මිල අඩුකිරීමට හෝ සීඝ්‍ර ලෙස ඉහළයාම පාලනයට සීනි සැපයුම වැඩිකළ යුතු බැවින්, මෙම බදු අඩුකිරීමේ තීරණය සුදු සහ දුඹුරු යන දෙවර්ගයේම සීනි සඳහා වූ රේගු සංකේතාංක වලට අදාළ කරන ලදී. |
| 6.4 | ඉහත අංක 6.1 සහ 6.3 හි පිළිතුර අදාළ වේ. |
| 6.5 | සීනි ආනයනකරුවන් සීමිත සංඛ්‍යාවක් මෙම ව්‍යාපාර අංශයේ යෙදෙන බව වගු අංක 17 මගින්ද තහවුරු වේ. එම 17 වගුව අනුව ප්‍රධාන ආනයනකරුවන් 09 දෙනෙකු එම කාලයට අදාළ සීනි ආනයනයෙන් 88% ක් පමණ ආවරණය කර ඇත. එබැවින් සමාගම් කීපයක් සඳහා විශේෂ කොට බදු සහනයක් ලබාදී නොමැත.<br>(i) වගු අංක 05 හි තොරතුරු අනුව 2020 ඔක්තෝබර් මාසයට සාපේක්ෂකව 2020 නොවැම්බර් සහ දෙසැම්බර් මාස වනවිට වෙළඳපල මිලෙහි යම් අඩුවීමක් (අවම වශයෙන් රු.10 සහ 18 ත් අතර පරාසයක හෝ ) වාර්ථා කරයි. නමුත් එය රු.49.75 ක් විය යුතුයැයි ගණන් බැලීම ප්‍රායෝගික නොවන්නේ ඒ වන විටත් වෙළඳපලේ රු.50ක් වූ ඉහළ බද්දක් ගෙවූ සීනි තොග වෙළඳපළ තුළ ව්‍යාප්ත වී ඇති පසුබිමකය.<br>(ii) එමෙන්ම මෙම විගණන වාර්ථාවේම, වගු අංක 10 සහ 11 මගින් වාර්ථා කර ඇති පරිදි ජාත්‍යන්තර වෙළඳපලේ සීනි මිල 2020 ඔක්තෝබර් වන විට ඇ.ඩො.395 සිට 2021 පෙබරවාරි වන විට ඇ.ඩො. 460.41 ක් දක්වා වැඩිවී ඇති බැවින් මෙම බදු අඩුකිරීම තුළින් පාරිභෝගිකයාට ලැබිය යුතු බදු වාසිය රු.49.75 ක් ම විය යුතුයැයි ගණනය කිරීම නිවැරදි නොවේ. |
| 6.6 | මෙම කාලයේදී බදු සංශෝධනයන් සම්බන්ධ තීරණයන් ගැනීම ප්‍රධාන වශයෙන් සිදුකරන ලද්දේ ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් Tariff Determination |

| | |
|---|---|
| | Committee මගිනි. තවද, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මගින් බදු සංශෝධනයන් සිදු කරන ක්‍රමවේදයන් 2021.03.21 දිනයෙන් විගණනය සඳහා යොමුකර ඇත **(ඇමුණුම 2).**<br><br>ඒ අනුව, මෙම බදු සංශෝධනය අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ජනාධිපතිතුමාගේ ලේකම් විසින් 2020.10.13 දින සවස 4.57 ට පමණ Fax පණිවුඩයක් මගින් එදින මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක කිරීමට දී ඇති උපදෙස් අනුව කටයුතු කරමින් **(ඇමුණුම 3)** අදාළ තීරණය ක්‍රියාත්මක කිරීම මුදල් අමාත්‍යාංශය විසින් සිදු කර ඇත.<br><br>එමෙන්ම ඒ ඒ රාජ්‍ය ආයතන වලට වෙන්වූ කාර්යභාරයන් පැවරී ඇති බැවින් එම වගකීම් පොදුවේ දැරියයුතු යැයි යන්න පිළිගත නොහැක. එනම්, මෙහිදී බදු සංශෝධන නියෝගය නිකුත්කිරීමේ වගකීම මුදල් අමාත්‍යාංශය මගින් ඉටුකළ යුතුවීම සහ පාරිභෝගික කටයුතු අධිකාරියේ කාර්යයන් ඊට වෙනස් ස්වරූපයන් ගන්නා බවත් පෙන්වා දිය හැක. |
| 6.7 සහ 6.8 | වෙළඳපල මිල පහළ දැමීම සඳහා සීනි සැපයුම වැඩි කිරීමේ න්‍යායාත්මක කරුණ මෙයින් සනාථ වේ. බදු අඩුකිරීමෙන් අපේක්ෂා කළ ප්‍රතිඵලයක් අනුව මෙම ප්‍රමාණාත්මක වෙනස සිදුවීම සැලකිල්ලට ගත යුතු අතර, මෙම බදු සංශෝධනය 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ නියමය පරිදි, එකී නියෝගයේ වලංගු කාලය මාස 03 කට සීමාකර පැනවීම නිසා සීනි ආනයනකරුවන් සහනදායී බද්දක් යටතේ වැඩිපුර සීනි තොග කඩිනමින් ආනයනයට පෙළඹීම සාමාන්‍ය ව්‍යාපාරික හැසිරීම වේ.<br><br>එසේ වුවද, ශත 25 ක්වූ සහනදායී බද්ද යටතේ 2020.10.14 සිට 2022.03.31 දක්වා කාලය තුළදී මෙරටට ආනයනය කර ඇති මුළු සීනි ප්‍රමාණය මෙ. ටොන් 857,571 වන අතර, එම සීනි ප්‍රමාණය ආනයනයට අදාළ මුළු කාලසීමාව වන මාස 17.5 කාලය ගත්විට, එය මාසික පාරිභෝජන අවශ්‍යතාවය (මෙ.ටොන් 48,926 ට ආසන්න අගයකි **(ඇමුණුම 4)** |
| 6.9 | 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ ඕනෑම ආනයනකරුවකුට පොදුවේ අදාළ වන පරිදි, (General Duty) 2020 ඔක්තෝබර් මස 13 දිනැති අංක 2197/12 දරන ගැසට් නිවේදනය මගින් සීනි සඳහා සහනදායී බද්දක් පැනවීම සිදුකරන ලදී. ඒ ඒ ව්‍යාපාරික මූල්‍ය ශක්තිය සහ තොග රඳවා ගැනීමට ඇති හැකියාව අනුව, අඩුබද්දක් පවතින විට වැඩි සීනි ප්‍රමාණයක් ආනයන කිරීම අපේක්ෂා කළ හැකි තත්ත්වයකි. |
| 6.10 | රේගු ආඥා පනත යටතේ පවතින නීතිරීති වලට යටත්ව වෙළඳාම පහසුකරලීම සඳහා (Trade Facilitation) ලබාදී ඇති පහසුකමකි බන්ධිත ගුදම් පහසුකම්. ඒ අනුව සීනි සඳහා බන්ධිත ගුදම් පහසුකම ව්‍යපාරික ආයතන 02 ක් විසින් ලබාගෙන ඇත (වගුව 15). මෙම බන්ධිත ගුදම් පහසුකම යටතේ ආනයනකරුවකුට විශාල තොගයක් එකවර රැගෙන විත් ප්‍රවාහන පිරිවැයේ වැනි වාසි ලබාගැනීමටත් , එය ගුදමින් ඉවත්කර ගන්නා අවස්ථාවේ පවතින බද්ද ගෙවීමට ද යටත් වේ. ඒ අනුව මෙම |

| | |
|---|---|
| | ආයතනය බදු අඩුකල විගස ව්‍යාපාරික වාසි සලකා අදාළ සීනි තොගය නිදහස් කරගෙන ඇත. |
| 6.11 | මෙම අවස්ථාවේදී අදාළ භාණ්ඩ 04 සඳහා බදු අඩුකිරීමට අදාල තීරණය ගැනීමෙන් පසුව ජනාධිපතිතුමාගේ ලේකම් විසින් මුදල් අමාත්‍යාංශය දැනුවත් කරන ලදී. ඒ අනුව අදාල තිරණය ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර ඇති අතර, මෙම බදු සංශෝධනය ජනාධිපතිතුමාගේ ලේකම් විසින් 2020. 10.13 දින සවස 4.57 ට පමණ fax පණිවුඩයක් මගින් එදින මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක කිරීමට දී ඇති උපදෙස් අනුව කටයුතු කර ඇත **(ඇමුණුම 3).** බදු සංශෝධනයන් සිදු කරන ක්‍රමවේදයන් 2021.03.21 දිනයෙන් විගණය සඳහා යොමුකර ඇත **(ඇමුණුම 2).** |
| 6.12 | ඉහත 6.11 පිළිතුර හා බැඳේ. තවද, බදු සංශෝධනයක් ක්‍රියාත්මක කිරීමට පෙර ආනයනකරුවන් සමඟ එකඟතාවයන්ට එළඹීමක් සිදුනොවන අතර, එම අභ්‍යන්තර තොරතුරු බදු සංශෝධනයකට පෙර ආනයනකරුවන් වෙත පත්වීමෙන්ද අයුතුලාභ ලබාගැනීමට අවස්ථා ඇතිවිය හැක. එසේ වුවද, ඒ ඒ කර්මාන්ත වල ඉදිරිපත් වන ගැටළුකාරී තතත්වයන් (අයවැය යෝජනා වැනි) සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථා වලදී සාකච්ඡා කර ඉහළ අනුමැතියට යොමු කරනු ලැබේ. |
| 6.13<br>6.14<br>6.15<br>6.16<br>(වාර්ථාවේ නැවත 6.15 ලෙස ඇත)<br>6.18<br>සහ<br>6.19 | පාරිභෝගික කටයුතු පිළිබද අධිකාරිය මගින් මෙම නිරීක්ෂණ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළ යුතුව තිබේ. |
| 6.17<br>6.20<br>6.21<br>සහ<br>6.22 | මේ සම්බන්ධයෙන් ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ඉදිරිපත්කර ඇති අංක ICED/3/2020/2 සහ 2020.04.07 දිනැති ලිපිය **(ඇමුණුම 5)** මගින් ඉදිරිපත් කර ඇත. |
| 6.23<br>6.24<br>සහ<br>6.25 | වෙළඳ අමාත්‍යාංශය සහ ලංකා සතොස ආයතනය මගින් මෙම නිරීක්ෂණ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළ යුතුව තිබේ. |
| 6.26<br>6.27<br>සහ<br>6.28 | විගණන වාර්තාවේ නිරීක්ෂණ හා එකගයි |

ANNEXTURE - 1

| Year | SCL Duty Rate ( Rs /per Kg) | | Effective Date | Gazette No & Date |
|---|---|---|---|---|
| | White Sugar | Brown / Raw Sugar | | |
| 2008 | 14 | Not applied SCL Duty | 09.01.2008 | 1531/13 -09.01.2008 |
| | 16 | Not applied SCL Duty | 07.11.2008 | 1574/11 -06.11.2008 |
| 2009 | 6 | 6 | 10.11.2009 | 1627/9 -09.11.2009 |
| | 1 | 1 | 21.12.2009 | 1632/37 - 20.12.2009 |
| 2010 | 10 | 10 | 18.06.2010 | 1658/31 – 17.06.2010 |
| 2011 | 10 | 10 | Duty not Change | |
| 2012 | 15 | 15 | 13.01.2012 | 1740/20 -12.01.2012 |
| | 20 | 20 | 20.06.2012 | 1763/11 -19.06.2012 |
| 2013 | 27 | 27 | 01.08.2013 | 1821/32 - 31.07.2013 |
| | 30 | 30 | 22.11.2013 | 1837/26 -21.11.2013 |
| 2014 | 25 | 25 | 22.05.2014 | 1863/13-21.05.2014 |
| | 28 | 28 | 16.07.2014 | 1871/23 -15.07.2014 |
| | 33 | 33 | 05.09.2014 | 1878/42- 2014.09.04 |
| | 28 | 28 | 02.12.2014 | 1891/8 -014.12.02 - |
| 2015 | 18 | 18 | 30.01.2015 | 1899/32 – 29.01.2015 |
| | 30 | 30 | 08.09.2015 | 1931/7 -07.09.2015 |
| 2016 | .25 cents | .25 cents | 19.07.2016 | 1976/4 – 18.07.2016 |
| | 2 | 15 | 16.09.2016 | 1984/26 -15.09.2016 |
| | 7 | 15 | 11.11.2016 | 1992/27 -10.11.2016 |
| | 13 | 15 | 20.12.2016 | 1998/5 -20.12.2016 |
| 2017 | 23 | 25 | 06.06.2017 | 2022/7 – 06.06.2017 |
| | 31 | 33 | 16.08.2017 | 2032/11 -15.08.2017 |
| 2018 | Remove SCL and impose Excise Duty Rs.30 per Kg and CID/ PAL/NBT 33 | | 18.09.2018 | 2089/19 -17.09.2018 |
| | 32 | 35 | 02.11.2018 | 2095/21 -01.11.2018 |
| 2020 | 50 | 50 | 22.05.2020 | 2176/18-21.05.2020 |
| | .25 cents | .25 cents (Normal Duty Structure applied on 12.01.2022) | 14.10.2020 | 2197/12 – 13.10.2020 |

# බද්දක් තීරණය කිරීමේදී සිදුකරනු ලබන කාර්යභාරය හා ක්‍රියාපිළිවෙත

## 1. අවශ්‍යතාව හඳුනාගැනීම සහ ඉදිරිපත් කිරීම

| | අවශ්‍යතාව හඳුනාගන්නා පාර්ශව | ඉදිරිපත් කිරීමේ ස්වභාවය |
|---|---|---|
| i. | ජනාධිපතිතුමා/ මුදල් ඇමතිතුමා හෝ අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදෙන විධානයන් අනුව | ගැසට් පත්‍රය සකස්කර ඇමතිතුමා වෙත අනුමැතියට සහ අත්සනට සටහනකින් ඉදිරිපත් කරයි . |
| ii. | අමාත්‍යාංශයක් හෝ රාජ්‍ය ආයතනයක් හෝ රජය විසින් පත්කළ කමිටුවක් විසින් කරනු ලබන නිර්දේශ | නිරීක්ෂණ සහිත සටහනක් මගින් බදු සංශෝධනය සිදු කිරීමට ගැසට් පත්‍රය සකස්කර ඇමතිතුමා වෙත අනුමැතියට සහ අත්සනට සටහනකින් ඉදිරිපත් කරයි . |
| iii. | ආනයනකරුවන් හෝ අගතියට පත් පාර්ශව කරුවන්ගේ ඉල්ලීම් | වෙළඳපල මිල/ ආනයන මිල ආදී දත්ත විශ්ලේෂණය කර බදු අනුපාත සංශෝධනය කළ හැකි / නොහැකි බව මුදල් ලේකම් වෙත සටහනක් ඉදිරිපත් කර ලැබෙන අනුමැතිය මත බදු සංශෝධනය සිදු කිරීම. |
| iv. | ජාත්‍යන්තර වෙළඳපල මිල උච්චාවචනයන් සහ දේශීය වෙළඳපල මිල වෙනස්වීම් මත ඇතිවන අවශ්‍යතාවයන්/ රටේ පවතින හදිසි අවස්ථාවක් මත ඇතිවන අවශ්‍යතා අනුව | වෙළඳපල මිල/ ආනයන මිල ආදී දත්ත විශ්ලේෂණය කර බදු අනුපාත සංශෝධනය කළ හැකි / නොහැකි බව මුදල් ලේකම් වෙත සටහනක් ඉදිරිපත් කර ලැබෙන අනුමැතිය මත ඇමතිතුමා වෙත අනුමැතියට සහ අත්සනට සටහනකින් ඉදිරිපත් කර බදු සංශෝධනය සිදු කිරීම. |

## 2. තීරණය කිරීම

| | |
|---|---|
| 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත | පනතේ 2 වන සහ 5 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් |
| 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත | පනතේ 2 වන වගන්තිය යටතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව අමාත්‍යවරයා විසින් |

## 3. තීරණය ක්‍රියාත්මක කිරීම

i. මුදල් අමාත්‍යවරයාට නියෝගයන් නිකුත් කිරීමට අවශ්‍ය ගැසට් නිවේදනයන් පිළියෙළ කර අනුමැතියට යටත්ව අත්සනට ඉදිරිපත් කිරීම.

ii. ගැසට් අංකයක් වෙන්කරවාගෙන මුද්‍රණය කිරීම

iii. ක්‍රියාත්මක කිරීමට රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීම

iv. වෙබ් පිටුවේ පළ කිරීම

## 4. අමාත්‍ය මණ්ඩල අනුමැතිය, රාජ්‍ය මුදල් කමිටුවේ අනුමැතිය සහ පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම

ඇමුණුම 02

ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

13th October 2020

Mr. S. R. Attygalle
Secretary
Ministry of Finance
Colombo 01

**<u>Relief to the Cost of Living</u>**

His Excellency the President has instructed to remove the prevailing Special Commodity Levy / applicable custom based taxes on lentil (Rs.10/Kg), canned fish (Rs. 50/425g can), Big onion (Rs. 50/Kg) and Sugar (Rs.50/Kg) with effect from midnight today.

Please issue necessary instructions to Director General of Customs after obtaining concurrence from Hon. Prime Minister / Minister of Finance.

P.B. Jayasundera
Secretary to the President

Copy : i. Hon. Basil Rajapaksa – Chairman of the Presidential Task for Economic Revival and Poverty Alleviation

ii. Mrs. J. M. Bhadrani Jayawardena - Secretary, Ministry of Trade - to brief the Hon. Minister

iii. Mr. Nushad Perera – Chairman, Sathosa – to make price adjustments to reflect the tax reduction and also to sell lentil at of Rs.150/Kg for those who purchase food baskets of canned fish, big onions and sugar in excess of Rs. 500/-

ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி ++ 94 (0) 11 2354418
ෆැක්ස් / தொலைநகல் ++ 94 11 2446657
ඊ-තැපෑල / மின்-அஞ்சல் prsec@presidentsoffice.lk

Annexure - 4

**Importation of Sugar**

Average annual imported quantity of sugar, Average monthly usage of Sugar during the period of 2016 to 2021 is (MTs) as follows.

| Year | Import Quantity per Year | Average Import Quantity per Month |
|---|---|---|
| 2016 | 644,813 | 53,734 |
| 2017 | 476,767 | 39,730 |
| 2018 | 633,006 | 52,750 |
| 2019 | 532,297 | 44,358 |
| 2020 | 669,865 | 55,822 |
| 2021 | 566,013 | 47,168 |
| **Average (6 years)** | **587, 126** | **48,927** |

(a) Total import quantity for last 17.5 months - 857,571 MT
*(Oct 14,2020 to Marh 31,2022)*
(b) Estimated consumption (48926*17.5) - 856,223 MT
(c) Balance Quantity in the Market (a-b) - 1349 MT

BY HAND

ඇමුණුම 03

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
இறக்குமதி ஏற்றுமதி கட்டுப்பாட்டுத் திணைக்களம்
IMPORT AND EXPORT CONTROL DEPARTMENT

අංක 75 - 1/3, පළමු මහල, හේමාස් ගොඩනැගිල්ල, යෝර්ක් වීදිය, තැ.පෙ. 559, කොළඹ 01.
இல. 75 - 1/3, 1 ஆம் மாடி, ஹேமாஸ் கட்டிடம், யோர்க் வீதி, த. பெ. 559, கொழும்பு 01.
No. 75 - 1/3, 1st Floor, Hemas Building, York Street, P. O. Box 559, Colombo 01.

මගේ අංකය / எனது இல. / My No. IECD/3/2020/2

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2020.04.07

2147
19 APR 2022

07 APR 2022

08 APR 2022
Office of the Secretary to the Treasury & Secretary Ministry of Finance

DG/FP
DG/IP

ලේකම්
මුදල් අමාත්‍යාංශය

**සීනි කිලෝග්‍රෑම් එකක් සඳහා පනවා තිබුණු විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු රු. 50 සිට ශත 25 දක්වා අඩු කිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට ලැබීම පිළිබඳව අධ්‍යනය කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව**

2022.03.24 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නියෝග හා බැඳේ

2. 2020 වර්ෂය මුල් භාගයේදී රට පුරා පැතිරී ගිය කොවිඩ්-19 වසංගතයේ අනපේක්ෂිත බලපෑම් හමුවේ මුල්‍ය වෙළෙඳපොළට සහ විනිමය අනුපාතිකයට සිදුවූ පීඩනය අවම කිරීම වෙනුවෙන් 2020 අප්‍රේල් මස සිට හඳුනාගත් භාණ්ඩ ආනයනය සීමා කරන ලද අතර එම භාණ්ඩ අතර සීනි ද විය. ආනයකරුගෙන් ලබා ගන්නා දින 180ක ණය පදනම මත සීනි ආනයනය සිදු කළ යුතු වූ අතර ඒ සඳහා වූ රෙගුලාසි 2020.04.16 දිනැති අංක 2171/05 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර තිබුණි.

3. සහනදායී මිලට පාරිභෝගික ජනතාව වෙත සීනි ලබා දීම සඳහා සීනි ආනයනය සඳහා වූ බදු මුදල ශත 25 දක්වා අඩු කරමින් 2020.10.13 දිනැති අංක 2197/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලදී. අනවශ්‍ය ලෙස සීනි තොග ආනයනය වීම පාලනය කිරීමේ අරමුණින් මුදල් අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, සීනි ආනයන බලපත්‍ර පාලනයට යටත් කරමින් සහ අදාළ බලපත්‍ර ගාස්තු ප්‍රසිද්ධ කරමින් 2020.10.29 දිනැති අංක 2199/20 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී.

4. යම්කිසි භාණ්ඩයක් ආනයනය පාලනයට යටත් කරන්නේ එම විෂයට අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන වල ඉල්ලීම් පදනම් කර ගනිමිනි. එහිදී ඒ සඳහා වන සාධාරණීකරනය සහ පාලන ක්‍රමවේදය පිළිබඳ යෝජනා/නිර්නායක අදාළ ආයතනය විසින් ඉදිරිපත් කල යුතුය. ඒ අනුව සීනි ආනයනය නියාමනය කිරීම සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ගයක් සකස් කර දෙන ලෙස වෙළෙඳ අමාත්‍යාංශය සහ උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කළද ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව වෙත නොලැබිණි. මෙලෙස, සුදුසු ක්‍රියාමාර්ගයක් සකස් කර ගන්නා තෙක් බලපත්‍ර නිකුත් කිරීම ප්‍රමාද කළ අතර සුදුසු ක්‍රමවේදයක් අදාළ ආයතන මගින් යෝජනා නොකළ බැවින් දෙපාර්තමේන්තුව විසින් භාවිත කරනු ලබන නියාමන විධි යොදා ගනිමින් සීනි සඳහා බලපත්‍ර නිකුත් කිරීම 2020.11.18 සිට ආරම්භ කරන ලදී.

TACW)

දුරකථන தொலைபேசி Telephone
කාර්යාලය அலுவலகம் Office 011 2326774
පාලක ජනරාල් கட்டுப்பாட்டாளர் நாயகம் Controller General 011 2324386
ෆැක්ස් தொலைநகல் Fax 011 2328486
ඊ-මේල් மின்னஞ்சல் E-mail deptimpt@sltnet.lk
වෙබ් வெப் Web http://www.imexport.gov.lk

5. මෙහිදී, වෙළෙඳපොළ තුළ සීනි හිඟයක් මතු වීම අවම කිරීම සඳහා, 2020.10.30 දින සිට බලපත්‍ර නිකුත් කිරීම ප්‍රමාද කළ කාල සීමාවේ දී ආනයනය කරන ලද සීනි තොග සඳහා අමතර ගාස්තු අය කර බලපත්‍ර නිකුත් කරන ලදී. සීනි සඳහා බලපත්‍ර ලබා දීමේදී බලපත්‍ර ගාස්තු සහ අමතර ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරන ලද මුල් ගැසට් පත්‍රය වූ 2016.02.11 දිනැති අංක 1953/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ වූ රෙගුලාසි පාදක කර ගන්නා ලදී.

6. 2016.02.11 දිනැති අංක 1953/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ III උපලේඛනය අනුව අතිරේක ගාස්තුව මි.ර.ගැ. වටිනාකමින් අවස්ථානුකූලව, භාණ්ඩ නැව්ගත කළ නමුත් භාණ්ඩ වරායට ලගා වීමට පෙර ආනයන පාලන බලපත්‍ර ලබා ගන්නා විට 4%ක් ලෙස සහ භාණ්ඩ වරායට ලගා වූ පසුව ආනයන පාලන බලපත්‍ර ලබා ගන්නා විට 5%ක් ලෙස අතිරේක ගාස්තුවක් අය කළ යුතුය. තවද ගැසට් පත්‍රයේ අංක 3 රෙගුලාසිය මගින් පහත පරිදි පාලක ජනරාල් වෙත ගාස්තු සම්බන්ධයෙන් බලය පවරා ඇත.

> ***ආනයන හා අපනයන පාලන බලපත්‍ර ගාස්තු සහ අතිරේක ගාස්තු අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමේ බලය ආනයන හා අපනයන පාලක ජනරාල් සතු වේ.***

7. දෙපාර්තමේන්තුව සතුව ඇති තොරතුරු අනුව අතිරේක ගාස්තු අය කිරීමෙන් රු.මි. 26,930,453.28 ක මුදලක් රජයට උපයා දී ඇති අතර අඩුකර ඇති අතිරේක ගාස්තු මුදල ලෙස රු.මි. 433,120,147 දක්වා ඇති නමුත් අඩුකර ඇත්තේ රු. මි. 37,039,589.42 පමණි. මෙම සහනය ලබා දෙන ලද්දේ 2020.10.30 දින සිට 2020.11.18 දින දක්වා භාණ්ඩ පටවන ලද ආනයනකරුවන් සඳහා පමණකි. (ඇමුණුම 1)

**2% අතිරේක ගාස්තු අය කිරීමේ තීරණයට පාදක වූ කරුණු පහත පරිදි පෙළගැස්විය හැකිය.**

I. අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමේ සාමාන්‍ය ක්‍රමවේදය අඛණ්ඩව සිදුවන ක්‍රියාවලියකි. සීනි ආනයනය බලපත්‍ර පාලනයට යටත් කරමින් පළකරන ලද ගැසට් පත්‍රය ඉතා හදිසියේ නිකුත් වූ අතර 2020.10.30 දින සිට ආනයනය කරන ලද සියළුම සීනි තොග සඳහා ආනයන පාලන බලපත්‍ර ලබා ගත යුතු විය. මෙම කාලපරිච්ඡේදය තුළ රටේ පැවති වාතාවරණය හේතුවෙන් ආනයනකරුවන්ට සහ මහජනතාව වෙත මෙම ගැසට් පත්‍රය පිළිබඳව සංනිවේදනය වීමේ අපහසුතා තිබූ අතර ඇතැම් ආනයනකරුවන් මෙම කරුණු පිළිබඳව දැනුම්වත් වී ඇත්තේ භාණ්ඩ නිෂ්කාශනය කරගැනීමට කටයුතු කරන අවස්ථාවේදීය. මෙම ක්‍රියාවලිය සැලකිල්ලට ගෙන භාණ්ඩ ආනයනය බලපත්‍ර යටත් කිරීමේදී සහන කාලයක් ලබාදීම සාමාන්‍ය සම්ප්‍රදාය වුවත්, මෙම අවස්ථාවේ දී 2020.10.30 වන විටත් ආනයන ක්‍රියාවලිය ආරම්භ කරන ලද ආනයනයකරුවන්ට සහන කාලයක් ලබා දී නොමැත. එබැවින් ආනයනකරුවන්, සැපයුම්කරුවන් සහ විදේශ රටවල බැංකු ගැටළුකාරී තත්ත්වයකට මුහුණ දී තිබුණු අතර ඒ වන විටත් දරා තිබූ වියදම් රටට අහිමි වීමේ අවධානමක් ද විය. අන්තර්ජාතික ගනුදෙනුවලදී මෙලෙස එක් වරම ආනයන ක්‍රියාවලින් අත්හිටුවීම මෙරට වාණිජ බැංකුවල මෙහෙයුම් කටයුතු වලට ද අයහපත් බලපෑමක් ඇතිකරනු ලබයි. තවද, එම ආනයනය ක්‍රියාවලිය ආපසු හැරවිය නොහැකිවීම හේතුවෙන් එම සීනි තොග වරාය පර්යන්තයේ ගොඩ ගසා තැබීමට ආනයනකරුවනට සිදු විය. එලෙස නිෂ්කාශනය නොකර පර්යන්ත වල තබා තිබූ සීනි සඳහා ප්‍රමාද ගාස්තු (Demurrages) ගෙවීමට ද ඔවුන්ට සිදු විය. එය රටේ විදේශ විනිමය අනවශ්‍ය ලෙස රටින් ඉවතට ගලායාම සඳහා හේතු වූ අතර එය පාලනය කිරීමේ අවශ්‍යතාව ද හඳුනාගන්නා ලදී. මෙම ක්‍රියාවලින් ආනයනකරුවන්ගේ පාලනයෙන් බැහැරව සිදුවන්නක් වන බැවින්, ආනයනකරු අගතියට පත්වීම (Penalize) සාධාරණ නොවේ. එබැවින්, ආනයනයකරුවන්ට සහ මෙරට වාණිජ බැංකුවලට මුහුණ දීමට සිදුවන අපහසුතා කඩිනමින් අවම කිරීම සඳහා සීනි සඳහා බලපත්‍ර නිකුත් කර ඒ සඳහා අයකරන ලද අතිරේක ගාස්තු

අවම කරන ලදී. මෙහි මූලිකම අරමුණ වූයේ රටේ විදේශ විනිමය අනවශ්‍ය ලෙස වැය වීම වැලැක්වීම හා විවිධාකාර ගාස්තු එකතු වීමෙන් ආනයනයකරුගේ අවසාන පිරිවැය ද පාරිභෝගික ජනතාව වෙත පැටවෙන බැවින් එය ද අවම කිරීම යි. එනම්, 2%ක් අමතර ගාස්තුවක් අය කිරීම, රජය විසින් ආනයනික බදු අඩු කිරීම තුළින් පාරිභෝගික ජනතාව වෙත සහන ලබා දීමට වූ අරමුණ ඉටු කිරීමට ගත් එක් පියවරක් ලෙස දැක්විය හැකිය. තවද 2020.10.30 - 2020.11.18 දින දක්වා බලපත්‍ර නිකුත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ආනයනකරුවන්ට බලපත්‍ර ලබා ගැනීමට හැකියාවක් නොමැති වීම පිළිබඳව ද මෙහිදී සැලකිල්ලට භාජනය කරන ලද අතර ඉහත සඳහන් කරන ලද කාල සීමාවේ සීනි ආනයනය කළ සියලුම ආනයනකරුවන් සඳහා පොදු සහනයක් ලබාදීමට තීරණය කරන ලදි.

II. ආනයන හා අපනයන පාලන රෙගුලාසි පළමු වරට උල්ලංඝනය කරනු ලබන ආනයනකරුවන්ට එය පහදා දී එය නිවැරදි කර ගැනීමට අවස්ථාවක් ලබා දීම සාමාන්‍ය ක්‍රමවේදය වන අතර අතිරේක ගාස්තු පැනවීම කරනුයේ එකී වැරැද්ද තව දුරටත් ආනයනකරුට ඒත්තු ගැන්වීමට සහ නිවැරදි දිශානතියකට ඔවුන් යොමු කිරීම සඳහා වන අතර ආදායම් එකතු කිරීම ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූලික අරමුණ නොවන බවද කාරුණිකව දන්වමි. එසේම මෙම කරුණු එම අවස්ථාවේ තිබූ වාතාවරණය සමඟ සලකා බලන ලෙසත් සමස්ත ක්‍රියාවලිය පවත්නා නෛතික ප්‍රතිපාදන අනුව යුක්ති සහගතවම සද්භාවයෙන් යුක්තවම සිදු කරන ලද්දක් බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

ටී. වී. ඩී. දමයන්ති එස්. කරුණාරත්න
ආනයන හා අපනයන පාලක ජනරාල්

**2% of additional charges charged from the sugar importers ( For the period of 30.10.2020 to 18.11.2020)**

| SL NO | Company Name | ICL NO | ICL date | License Qty (MT) | License Fee (LKR) | VAT | 2% | Wave off Amount |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | CBL FOODS INTERNATIONAL PVT LTD. | 3351 | 27.11.2020 | 1800 | 668,975.00 | 53,518.00 | 467,233.00 | 467,233.00 |
| | | | | | | | 467,353.00 | 467,353.00 |
| | | | | | | | 494,487.00 | 494,487.00 |
| 2 | CEYLON BISCUITS LIMITED | 3435 | 02.12.2020 | 700 | 260,039.00 | 20,803.00 | 790,719.00 | 790,719.00 |
| 3 | CEYLON COLD STORES PLC | 3224 | 21.11.2020 | 250 | 92,977.00 | 7,438.00 | 464,883.00 | 697,324.50 |
| | | 3265 | | 250 | 92,977.00 | 7,438.00 | 464,883.00 | 697,324.50 |
| 4 | COCA COLA | 3313 | 23.11.2020 | 250 | 79,119.00 | 6,330.00 | 39,595.00 | 59,392.50 |
| | | | | | | | 197,970.28 | 296,955.42 |
| 5 | GLOBAL TRADING & COMPANY | 3345 | 24.11.2020 | 3000 | 943,605.00 | 75,488.00 | 1,023,678.00 | 1,535,517.00 |
| | | | | | | | 213,266.00 | 319,899.00 |
| | | | | | | | 643,298.00 | 643,298.00 |
| | | 3241 | 23.11.2020 | 540 | 170,555.00 | 13,644.00 | 852,773.00 | 1,279,159.50 |
| | | 3242 | 23.11.2020 | 702 | 221,721.00 | 17,738.00 | 1,108,604.00 | 1,662,906.00 |
| | | 3244 | 23.11.2020 | 830 | 262,149.00 | 20,972.00 | 1,310,743.00 | 1,966,114.50 |
| 6 | NESTLE LANKA PLC | 3429 | 30.11.2020 | 153.6 | 51,556.00 | 4,124.00 | 306,887.00 | 306,887.00 |
| | | 3383 | 25.11.2020 | 300 | 98,284.00 | 7,863.00 | 491,418.00 | 737,127.00 |
| | | 3390 | 26.11.2020 | 25 | 11,881.00 | 951 | 59,407.00 | 89,110.50 |
| 7 | NEW BENSON TRADING (PVT) LTD | 3338 | 26.11.2020 | 270 | 82,650.00 | 6,612.00 | 413,251.00 | 619,876.50 |
| | | 3276 | 23.11.2020 | 322 | 104,352.00 | 8,348.00 | 521,760.00 | 782,640.00 |
| | | 3277 | 23.11.2020 | 351.5 | 99,969.00 | 7,998.00 | 499,846.00 | 749,769.00 |
| | | 3278 | 23.11.2020 | 650 | 226,021.00 | 18,082.00 | 1,130,107.00 | 1,695,160.50 |
| | | 3272 | 23.11.2020 | 270 | 91,542.00 | 7,323.00 | 457,708.00 | 686,562.00 |
| | | 3273 | 23.11.2020 | 268 | 86,852.00 | 6,948.00 | 434,260.00 | 651,390.00 |
| | | 3274 | 23.11.2020 | 542 | 154,149.00 | 12,332.00 | 770,744.00 | 1,156,116.00 |
| | | 3275 | 23.11.2020 | 675 | 191,975.00 | 15,358.00 | 959,874.00 | 1,439,811.00 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 8 | PALLIGODA TRADING CO. (PVT) LTD | 3293 | 23.11.2020 | 650 | 225,194.00 | 18,016.00 | 1,125,972.00 | 1,688,958.00 |
| | | 3292 | 23.11.2020 | 135 | 41,325.00 | 3,306.00 | 206,626.00 | 206,626.00 |
| | | 3291 | 23.11.2020 | 405 | 123,975.00 | 9,918.00 | 619,877.00 | 619,877.00 |
| | | 3294 | 23.11.2020 | 650 | 225,194.00 | 18,016.00 | 1,125,972.00 | 1,688,958.00 |
| | | 3299 | 23.11.2020 | 650 | 226,021.00 | 18,082.00 | 1,130,107.00 | 1,695,160.50 |
| | | 3300 | 23.11.2020 | 270 | 91,542.00 | 7,323.00 | 457,708.00 | 686,562.00 |
| | | 3301 | 23.11.2020 | 134 | 43,426.00 | 3,474.00 | 217,130.00 | 325,695.00 |
| | | 3302 | 23.11.2020 | 405 | 139,434.00 | 11,155.00 | 697,172.00 | 1,045,758.00 |
| | | 3391 | 23.11.2020 | 378 | 115,710.00 | 9,257.00 | 578,552.00 | 578,552.00 |
| | | 3392 | 26.11.2020 | 270 | 82,650.00 | 6,612.00 | 413,251.00 | 413,251.00 |
| | | 3393 | 26.11.2020 | 162 | 49,590.00 | 3,967.00 | 247,951.00 | 247,951.00 |
| 9 | R G BROTHERS | 3239 | 21.11.2020 | 408 | 118,831.00 | 9,506.00 | 594,154.00 | 891,231.00 |
| 10 | S.M.A. AZEEZZ BROTHERS (PVT) LTD | 3208 | 20.11.2020 | 270 | 169,374.00 | 13,550.00 | 846,871.00 | 1,270,306.50 |
| | | 3209 | 20.11.2020 | 270 | 75,614.00 | 6,049.00 | 378,068.00 | 567,102.00 |
| | | 3210 | 20.11.2020 | 540 | 168,971.00 | 13,518.00 | 844,855.00 | 1,267,282.50 |
| | | 3212 | 20,11.2020 | 286 | 101,829.00 | 8,146.00 | 509,147.00 | 763,720.50 |
| 11 | SMART DRAGON LANKA PVT LTD | 3195 | 21.11.2020 | 270 | 75,210.00 | 6,017.00 | 376,051.00 | 564,076.50 |
| 12 | THE APPOLLO HOLDINGS (PVT) LTD | 3470-1 | 01.12.2020 | 0.603 | 2,132.00 | 171.00 | 10,662.00 | 15,993.00 |
| 13 | WOODLANDS COMPANY | 3290-3 | 23.11.2020 | 810.00 | 247,951.00 | 19,836.00 | 415,526.00 | 415,526.00 |
| | | 3303-1 | 23.11.2020 | 540 | 165,300.00 | 13,224.00 | 415,526.00 | 415,526.00 |
| | | 3303-2 | | | | | 415,526.00 | 415,526.00 |
| 14 | VARUN BEVERAGES LANKA (PVT) LTD | 3520 | 19.11.2020 | 125 | 45,874.00 | 3,670.00 | 229,369.00 | 229,369.00 |
| 15 | OLE SPRING BOTTLERS (PVT) LTD | 3519 | 03.12.2020 | 250 | 97,927.00 | 7,834.00 | 489,633.00 | 734,449.50 |
| | | | | **20027.703** | **6,624,422.00** | **529,955.00** | **26,930,453.28** | **37,039,589.42** |